දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாய'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ED/1/1/5/1

දිනය / திகதி / Date 2017.01. 11

**චක්‍රලේඛ අංකය - 4/2017**

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්
සියළුම කලාප අධ්‍යක්ෂකවරුන්,
සියළුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ. වරුන්,
සියළුම විදුහල්පතිවරුන්

**සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2017**

අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වාර්ෂිකව පැවැත්වෙන උක්ත උළෙල 2017 වසර සඳහා නියමිත උක්ත නාට්‍ය උළෙල පැවැත්වීමට අදාළ කොන්දේසි සහ නිර්මාණ ඉදිරිපත් කළ යුතු ශීර්ෂ මෙහි ඇති උපදෙස් සංග්‍රහයේ දැක්වේ. මේ පිළිබඳව ඔබ පළාතේ / කලාපයේ / කොට්ඨාසයේ / විදුහලේ අදාළ ගුරු භවතුන් සහ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් දැනුවත් කර මෙම උළෙල සඳහා ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කරවීමට කටයුතු කරන මෙන් මෙයින් දන්වමි.

**මේ සමඟ ඇති උපදෙස් සංග්‍රහය පහත ආකාරයෙන් සමන්විතය**

- පිටු අංක 02 සිට 11 දක්වා උළෙලේ හැඳින්වීම, මූලික අරමුණු හා පොදු නීති රීති
- පිටු අංක 12 සිට 17 දක්වා උළෙලට ඉදිරිපත් විය හැකි කාණ්ඩ 3 කට අයත් ශීර්ෂ
- පිටු අංක 18 පොදු අයදුම් පත්‍රයේ ආකෘති පත්‍රය

උළෙලෙහි 1 කාණ්ඩයෙහි පළමු වටය වන පිටපත් වටය උපදෙස් සංග්‍රහයේ කොන්දේසීන්ට අනුකූලව 2017 මාර්තු 31 දින වන විට මෙම අමාත්‍යාංශය විසින් පවත්වා අවසන් කෙරේ.
1 හා 3 කාණ්ඩවල පළාත් වටයන් 2017 ජුනි මස 25 දිනට පෙර අවසන් කළ යුතු වේ.

2017 ජුනි මස 10 සහ 11 දෙදින මෙහි ජාතික වටයේ 1 අදියර ද, ( 2 කාණ්ඩයේ නාට්‍ය ශීර්ෂ සඳහා) 2017 ජුලි මස 15 සහ 16 දෙදින ජාතික වටයේ 2 අදියර ද ( 1 හා 3 කාණ්ඩවල නාට්‍ය ශීර්ෂ) පවත්වා අවසන් කෙරේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

# සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල – 2017

## උපදෙස් සංග්‍රහය

### හැඳින්වීම

නාට්‍ය හා රංග කලා විෂය පිළිබඳ ප්‍රායෝගික සහ විෂයානුබද්ධ අත්දැකීම් රාශියක් දිවයිනේ පාසල්වල සිසුනට ලබාදීමත්, සිසුන් සහ ගුරුවරුන් නිර්මාණකරණයට යොමුකිරීමත්, ඔවුන්ගේ නාට්‍ය රසඥතා හැකියාවන් වර්ධනය කොට වින්දන ශක්තීන් දියුණු කිරීමත් යන අභිප්‍රායන් පෙරදැරි කොටගෙන මෙම උළෙල සංවිධානය කෙරේ. පාසල්වල දැනට ක්‍රියාත්මක වන විෂයමාලාවෙහි නාට්‍ය හා රංගකලා විෂය 6 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ම ඇතුළත්ව ඇති බැවින් මෙම උළෙල සංවිධානය කිරීමෙන් එම විෂය සංවර්ධනය සඳහා සුවිශේෂී දායකත්වයක් ලැබෙනු ඇත. සිසුන් තුල යහපත් ආකල්ප පෝෂණය කරමින් ජාතියේ සංවර්ධනය අරමුණු කොට ගෙන සිසු දරු දැරියන්ගේ පෞරුෂය සංවර්ධනය කිරීම උදෙසා ද මෙම උළෙල දායක වේ. ඉන් ජාතික මට්ටමින් ඇගයීමට ලක් කෙරෙන සිසුන් උසස් අධ්‍යාපනයට යොමු වීමේ දී ප්‍රමුඛතාවයට පත් වේ.

### උළෙලේ මූලික අරමුණු

1. සිසුන්ගේ හා ගුරු භවතුන්ගේ නිර්මාණාත්මක චින්තනය වර්ධනය කිරීම.
2. විචාර ශක්තිය හා වින්දන ශක්තිය දියුණු කිරීම.
3. නාට්‍ය හා රංග කලා විෂයමාලාව තුළ එහි ප්‍රායෝගික අංශය සංවර්ධනය කිරීම.
4. ගුණාත්මක නාට්‍ය නිර්මාණයට මං පෙත් හෙළි කිරීම.
5. නිර්මාණ කුසලතා ප්‍රදර්ශනය කිරීමේ අවස්ථා සැලසීම.
6. නාට්‍ය පිටපත් රචනා කිරීමේ කුසලතාව වර්ධනය කිරීම.
7. නාට්‍යකරණයෙහි නව අත්හදා බැලීම් හා නව පර්යේෂණයන් සඳහා සිසුන් හා ගුරුභවතුන් යොමු කිරීම.
8. පාසල් ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ගේ රංගන ප්‍රතිභාවයන් හඳුනාගෙන සංවර්ධනය කිරීම.
9. ප්‍රාසංගික කලා ක්ෂේත්‍රයට ප්‍රවේශවීම සඳහා සිසුන්ට මූලික පදනමක් සම්පාදනය කර දීම.
10. නාට්‍ය ක්‍රියාකාරකම් ඇසුරෙන් සිසුන්ගේ පෞරුෂ වර්ධනය.
11. නිර්මාණකරණය මගින් පාසල තුළ හා පාසලෙන් පරිබාහිර ප්‍රජාව අතර අන්‍යෝන්‍ය සහයෝගීතාවය සහ සහජීවනය ප්‍රවර්ධනය කිරීම.

### උළෙල පිළිබඳ පොදු නීති රීති

**1. මෙම උළෙල පහත සඳහන් පරිදි කාණ්ඩ තුනකට බෙදේ.**

- 1 කාණ්ඩය - **කෙටි නාට්‍ය නිෂ්පාදන** (ළමා නාට්‍ය, කෙටි නාට්‍ය, විශ්ව ළමා සාහිත්‍ය පාදක නාට්‍ය, විදේශීය නාට්‍ය ආශ්‍රිත නාට්‍ය, කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම)
- 2 කාණ්ඩය - **නිර්දේශිත නාට්‍ය ජවනිකා** (යෝජිත දේශීය/විදේශීය නාට්‍යකරුවන්ගේ නාට්‍ය, සංස්කෘත, ග්‍රීක, රෝම හා ශේක්ෂ්පියර් නාට්‍ය සහ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය ආශ්‍රිත නාට්‍ය ජවනිකා ප්‍රතිනිර්මාණය)
- 3 කාණ්ඩය - **භූමිකා රංගන** (නිර්දේශ කරන/තෝරාගත් නාට්‍ය කෘතීන්ගේ සංවාද ඛණ්ඩයක්/සංවාද ඛණ්ඩ හෝ කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම)

**2. රංගන දායකත්වය අනුව මෙම උළෙල පහත සඳහන් පරිදි අංශ 04 කට බෙදා ඇත.**

- ප්‍රාථමික අංශය - (1-5 දක්වා ශ්‍රේණි සඳහා)
- කනිෂ්ඨ ද්විතීයික අංශය - (6-9 දක්වා ශ්‍රේණි සඳහා)
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය - (10-13 දක්වා ශ්‍රේණි සඳහා)
- විවෘත අංශය - (1-13 දක්වා ශ්‍රේණි සඳහා)

2.1 1 හෝ 2 කාණ්ඩයෙන් ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශයෙන් ඉදිරිපත් කරන යම් නාට්‍යයක **පෙළ විසින් ඉල්ලා සිටිනු ලැබෙන සුවිශේෂ අවස්ථාවක දී** පහළ ශ්‍රේණියක දරුවෙක් හෝ කිහිප දෙනෙක් රංගනය සඳහා අත්‍යවශ්‍ය වේ නම් පූර්ව අවසරයක් මත පමණක් එසේ කළ හැකි ය. අයදුම්පත හෝ අයදුම්පත සමග නාට්‍ය පිටපත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අවස්ථාවේ දී එම ඉල්ලීම ලිඛිතව අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලීම නිර්මාණයේ සාර්ථකත්වය සඳහා සාධාරණ බැව් සමාලෝචනයේ දී පෙනී යන්නේ නම් පමණක් ඒ සඳහා අවසර ලබා දේ.

**3. මෙම උළෙලේ ජාතික වටයේ නාට්‍ය වේදිකාගත කිරීම පහත සඳහන් පරිදි අදියර 02 කට බෙදා ඇත.**

- 1 අදියර - (2 කාණ්ඩය සඳහා)
- 2 අදියර - (1 හා 3 කාණ්ඩ)

**4. සහභාගීත්වය**

4.1 රජයේ පාසල්වල සිසුන්, පිරිවෙන්වල ඉගෙනුම ලබන සිසුන් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත පෞද්ගලික පාසල්වල සිසුන්ට සහ ගුරු භවතුන්ට මෙම උළෙල සඳහා සහභාගී විය හැක.

4.2 නාට්‍ය හා රංග කලා විෂය ඉගැන්වෙන පාසල්වල සිසුන් හා ගුරු භවතුන් මෙම උළෙලට **අනිවාර්යයෙන්ම** සහභාගි වීම අපේක්ෂා කෙරේ.

4.3 මෙම උළෙලට යම් පාසලක 01 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට සහභාගී වීමට හැකි අතර, එම විදුහල උළෙලට අයදුම් කරන වර්ෂයේ දී එම විදුහල මගින් දෙ වන වර උසස් පෙළ විභාගය සඳහා, පෙනී සිටින සිසුන්ට 2017 වර්ෂයේ ජූලි මස 31 දින තෙක් සහභාගී විය හැකි ය.

4.4 මීට පෙර සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා තරගයන්ට හා සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙලවලට ඉදිරිපත් කොට ජයග්‍රහණ ලබාගත් පිටපත්, හෝ නිර්මාණ මෙම උළෙල සඳහා නිෂ්පාදනය කළ නො හැකිය. එහෙත් උළෙල පැවැත්වෙන වර්ෂයට පෙර වසර තුළ නිෂ්පාදනය කොට වෙනත් නාට්‍ය තරගවල හෝ උළෙලවල ජයග්‍රාහී ස්ථාන ලබාගත් නාට්‍යවලට මීට සහභාගී විය හැකි ය.

4.5 2015 සහ 2016 යන වර්ෂ දෙකෙහි දී **ම** මෙම උළෙල සඳහා **අඛණ්ඩව එකම ශීර්ෂය යටතේ** සමස්ත ලංකා මට්ටමේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන අතරින් කවර හෝ ස්ථානයන් ලබා ගත් පාසලකට 2017 වර්ෂයේ දී එම ශීර්ෂයෙන්ම / ශීර්ෂවලින්ම ඉදිරිපත් විය නොහැක.

4.6 ඉහත 4.5 වගන්තියේ සීමාවන්ට යටත්ව, මෙම චක්‍රලේඛයෙහි **2 කාණ්ඩයේ** නාට්‍ය ශීර්ෂයන්ට අයත් වන නාට්‍යයන්ගෙන් කවර හෝ නාට්‍යයක කොටසක් මීට පෙර සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා තරගයකට හෝ උළෙලකට ඉදිරිපත් කළ ඕනෑම පාසලකට, තමන් ඒ සඳහා ඉදිරිපත් කළ නාට්‍ය කොටසම නැවත ඉදිරිපත් කළ නොහැකි ය. එම නාට්‍යයේම වෙනත් කොටසකින් මේ සඳහා සහභාගී වීමට බාධාවක් නොමැත.

4.7 වෙනත් පාසලක ගුරුවරයකු හෝ ශිෂ්‍යයෙකු නොවන බාහිර ශිල්පීන්, කිසිදු විටෙක ආනුෂංගික ශිල්පීය අවශ්‍යතාවන් සඳහා සහභාගි කරවා නො ගත යුතු ය.

4.8 තම පාසල මෙම උළෙලට සහභාගී කරවීම සහ අවශ්‍ය සියලු සහයෝගයන් ලබා දීම විෂය භාර ගුරුවරුන්ගේ ද, විදුහල්පතිවරුන්ගේ ද වගකීම වන අතර මෙම චක්‍රලේඛයේ ඇතුළත් සෑම ශීර්ෂයක්ම නියෝජනය වන පරිදි උළෙලට සම්බන්ධ වීමට

තම පළාතේ හා කලාපයේ පාසල් දිරි ගැන්වීම අදාල පළාතේ / අධ්‍යාපන කලාපයේ සෞන්දර්ය විෂය භාර නිලධාරීන්ගේ වගකීම වේ.

## 5. අයදුම් කිරීම

5.1 1 කාණ්ඩයට ඉදිරිපත් වන පාසල්වලට 2 කාණ්ඩය සඳහා ඉදිරිපත් විය නොහැකි අතර 3 කාණ්ඩයේ සියලු ශීර්ෂයන් සඳහා ඉදිරිපත් විය හැකි ය.

5.2 2 කාණ්ඩය සඳහා ඉදිරිපත් වන පාසල්වලට 1 කාණ්ඩය සඳහා ඉදිරිපත් විය නොහැකි අතර 3 කාණ්ඩයේ සියලු ශීර්ෂයන් සඳහා ඉදිරිපත් විය හැකි ය.

5.3 3 කාණ්ඩයට අයදුම් කළ හැක්කේ 1 කාණ්ඩයේ හෝ 2 කාණ්ඩයේ නාට්‍ය නිෂ්පාදනයක් සඳහා අයදුම් කරන පාසල්වලට පමණි.

5.4 1 හෝ 2 කාණ්ඩයෙන් පාසලකට ඉදිරිපත් කළ හැකි උපරිම ශිර්ෂ සංඛ්‍යාව 02 ක් වන අතර 3 කාණ්ඩය හෙවත් භූමිකා රංගන හා කතා පුවත් ඉදිරිපත් කිරීම පිළිබඳ අංශයේ දී උපරිම ශීර්ෂ 02ක් සඳහා ඉදිරිපත් විය හැකිය.

5.5 1 කාණ්ඩයේ **කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම** සඳහා ඉදිරිපත් විය හැක්කේ ද 1 කාණ්ඩයේ වෙනත් නාට්‍ය නිෂ්පාදනයක් සඳහා ඉදිරිපත් වන පාසල්වලට පමණි.

5.6 මෙහි 2 කාණ්ඩයට අයත් වන යම් නාට්‍යයක් ඉදිරිපත් කරන යම් පාසලක් 3 කාණ්ඩයේ භූමිකා රංගන හා කතා පුවත් ඉදිරිපත් කිරීම පිළිබඳ අංශයෙහි නාට්‍යයක් තෝරා ගැනීම ආශ්‍රිත ශීර්ෂයකට ඉදිරිපත් වන විට, ඒ සඳහා 2 කාණ්ඩයේ දී තෝරාගත් නාට්‍යයම තෝරාගත නොහැකි ය.

5.7 භූමිකා රංගන හා කතා පුවත් ඉදිරිපත් කිරීම පිළිබඳ අංශයෙහි 3 කාණ්ඩයේ නාට්‍ය අතර ඇති යම් නාට්‍යයක් උළෙල පැවැත්වෙන වර්ෂයට පූර්වාසන්න වර්ෂ දෙකෙහි දී සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙලේ 2 කාණ්ඩය සඳහා නිෂ්පාදනය කොට ජාතික වටයේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානයක් යම් පාසලක් විසින් ලබා ඇත් නම් එම පාසල්වලට ද තමන් 2 කාණ්ඩයෙන් ඉදිරිපත් වූ එම නාට්‍යය මෙවර 3 කාණ්ඩයෙහි අදාල ශීර්ෂයක් සඳහා භාවිත කළ නොහැකි ය.

5.8 **ඉහත සඳහන් සහභාගීත්ව සීමාවන් ඉක්මවා අයදුම්පත් ඉදිරිපත් කිරීම උළෙලේ සංවිධාන හා පරිපාලන කටයුතු සඳහා බාධාවක් බැවින් එම සීමාවන් නොතකා සහ සීමාව ඉක්මවා අයදුම්පත් ඉදිරිපත් කරන පාසල් උළෙලේ කිසිදු ශීර්ෂයක් සඳහා ලියාපදිංචි කර නොගැනේ.**

5.9 අයදුම්පත් එවීම සඳහා පහතින් සඳහන් කෙරෙන අවසාන දිනයට හෝ ඊට පෙර වන විට රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙහි සඳහන් පරිදි විධිමත්ව අයදුම්පත් ඉදිරිපත් කළ පාසල් නාම ලේඛනය, **www.moe.gov.lk** දරන අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධියට පත් කෙරේ. අවසාන දිනයට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නොගැනේ.

5.10 **1 කාණ්ඩයේ ශීර්ෂයන් සඳහා ඉදිරිපත් කරන නාට්‍යවල පිටපත් A4 කඩදාසිවල, සම්මත නාට්‍ය පිටපත් ආකෘතියට අනුව පිටුවේ අවකාශය බෙදා ගනිමින්, පොයින්ට් 12 අක්ෂර ප්‍රමාණයෙන් පරිගණක යතුරු ලියනය කොට තිබීම අනිවාර්ය වේ. එසේ නොඑවන පිටපත් ප්‍රතික්ෂේප කෙරේ.**

5.11 උළෙලට ඉල්ලුම් කිරීමේ දී මෙම උපදෙස් අවසානයට උපලේඛන ගත කර ඇති A යන පොදු ඉල්ලුම්පත් ආකෘතිය පමණක් භාවිත කළ යුතු ය.

5.12 **ඉල්ලුම් කරන ශීර්ෂ සියල්ලම ඉහත** A යන පොදු ඉල්ලුම්පත් ආකෘතියෙහි එක් පිටපතක පමණක් සම්පූර්ණ කොට ඉදිරිපත් **කළ යුතු අතර ඒ ඒ ශීර්ෂ සඳහා වෙනම අයදුම්පත් නොඑවිය යුතු ය.**

5.13 ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඉතා පැහැදිලි අකුරින් එය සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

5.14 ඉහත ඉල්ලුම් පත්‍රය **2017 පෙබරවාරි 17** දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත **ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.** මෙහි පිටපතක් තම පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද අනිවාර්යයෙන්ම යැවිය යුතු අතර උළෙලට අයදුම් කළ සේ සලකනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත **ලියාපදිංචි තැපැලෙන්** අයදුම් කළේ නම් පමණි. මෙම උපදෙස්වලට පටහැනිව ලැබෙන ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

5.15 උළෙලට අදාල චක්‍රලේඛය අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk දරන වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කෙරෙන අතර, සියලු පළාත්, කලාප කාර්යාලවලට මුද්‍රිත පිටපතක් එවනු ලැබේ. එය නිකුත් වූ විට අදාල පළාත් සහ කලාප සෞන්දර්ය විෂයභාර නිලධාරීන් එම චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස්වලට අනුකූලව තම පළාතේ/කලාපයේ පාසල්වලට අයදුම්කිරීමට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් පවත්වා ඔවුන් දිශානුගත කිරීම අපේක්ෂා කෙරේ.

5.16 තම කලාපයේ / පළාතේ පාසල් මේ සඳහා අයදුම් කිරීමේ ප්‍රගතිය දෛනික පදනමින් පිරික්සා බලා අදාල නිලධාරීන්ට අවශ්‍ය කටයුතු සිදු කිරීම පහසු වනු පිණිස, අයදුම්පත් එවිය යුතු අවසාන දිනට සති 03කට පෙර පටන්, අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබෙන **නිවැරදි** අයදුම්පත් පිළිබඳ තොරතුරු ඒ ඒ පළාත් දෙපාර්තමේන්තුවලට ද දෛනිකව දැනුම් දෙනු ලැබේ.

5.17 සහභාගී වන සිසු සිසුවියන්ගේ නම් සහිත සවිස්තරාත්මක තොරතුරු, අදාල පළාත් හෝ සමස්ත ලංකා වටයන්ට පූර්වාසන්නයෙන් **නියම කරනු ලබන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.** එම නියම කරනු ලබන අවස්ථාවේදී සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකරන පාසල්වලට අදාල ඇගයීම් වටයට ඉදිරිපත් විය නොහැකි ය.

5.18 පසුව සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේ දී **නම්වල මුල් අකුරු ඉංග්‍රීසියෙන් ලිවිය යුතු ය**.

5.19 මෙහි අංක 1.1.1, 1.2.1, 1.2.2, 1.3.1 හා 1.4.1 දරන ශීර්ෂයන් සඳහා නිෂ්පාදනය කරනු ලබන නාට්‍යවල පිටපත්, අදාල පාසලේ විදුහල්පති විසින්, **2017 පෙබරවාරි මස 17** දිනට පෙර පිටපත් **තුනකින්** යුතුව අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශයේ අධ්‍යක්ෂ වෙත **අනිවාර්යයෙන්ම** යොමු කළ යුතුය. ඉන් **එක් පිටපතක** පෙළ රචකගේ නම, අදාල විදුහලේ විදුහල්පතිගේ නම, අත්සන හා නිල මුද්‍රාව සටහන් කළ යුතු ය. **අනෙක් පිටපත් දෙකෙහි කිසිදු ස්ථානයක, විදුහලෙහි හෝ පුද්ගලයකුගේ අනන්‍යතාවයක් හඳුනාගත හැකි කිසිවක් සටහන් නොවිය යුතුය.**

5.20 අංක 1.1.1, 1.2.1, 1.2.2, 1.3.1 හා 1.4.1 දරන ශීර්ෂයන්ට අදාල නාට්‍ය පිටපත්, මෙහි අවසානයට ඇති ආකෘති පත්‍රය සමග පහත ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන් පමණක්** එවිය යුතු ය. ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි **'සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2017'** යනුවෙන් සටහන් කළ යුතු ය.

5.21 අයදුම්පත් පිටපත් සහ නාට්‍ය පිටපත් එවිය යුතු ලිපිනය:

අධ්‍යාපන අධ්‍යක්ෂ,
සෞන්දර්ය අධ්‍යාපන ඒකකය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

5.22 උළෙලේ 1 කාණ්ඩයේ ප්‍රථම වටය වන පිටපත් ඇගයීම විනිශ්චය වටයක් වන බැවින් රාජ්‍ය නාටය අනුමණ්ඩලය විසින් නිර්දේශිත, ජාතික මට්ටමේ නාට්‍ය හා රංග කලා විෂය විශේෂඥයින්ගෙන් සමන්විත ඇගයීම් මණ්ඩලයක් මගින් එම කටයුත්ත සිදු කෙරෙන අතර, දෙන ලද කාල සීමාව තුළ ඉහත ලිපිනයට විධිමත්ව නො එවන නාට්‍ය පිටපත් මොන ම හේතුවක් නිසාවත් ඇගයීම සඳහා භාර නො ගැනේ.

5.23 අංක 2.1.1, 2.1.2, 2.2.1, 2.2.2, 2.2.3, 2.2.4 සහ 2.3.1 යන ශීර්ෂයන්ට අදාලව, තෝරාගත් නාට්‍ය කොටස පිළිබඳ වචන 100ක පමණ සාරාංශයක් තම අයදුම්පත සමග එවිය යුතු වේ.

5.24 පිටපත් ඇගයීමට ලක් කළ 1 කාණ්ඩයේ නාට්‍ය ඇගයීම් මණ්ඩල නිර්දේශ අනුව නිෂ්පාදනය කිරීමට හෝ සංශෝධන සහිතව නිෂ්පාදනය කිරීමට හෝ මෙම අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශය වෙතින් ලිඛිතව අදාල පාසල වෙත අවසර ලබා දේ. ඉන් පසු එම නාට්‍යය පළාත් උළෙලට ඉදිරිපත් කළ යුතු ය.

5.25 ඉහත කොන්දේසිවලට පටහැනිව හෝ ඒවා නොතකා අයදුම්පත් ඉදිරිපත් කිරීම අදාල විදුහලේ නොසැලිකිලිමත් බවක් සේ සලකන බැවින් එවන් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 6. උළෙල අවස්ථා

6.1 මෙම උළෙල අවස්ථා 03 කින් පමණක් සමන්විත වේ.

- පිටපත් වටය — 1 කාණ්ඩයේ 1.1.1, 1.2.1, 1.2.2, 1.3.1 හා 1.4.1 ශීර්ෂ සඳහා
- පළාත් උළෙල: — 1 කාණ්ඩයේ පිටපත් ඇගයීමට ලක් කරන ශීර්ෂවල හොඳම පිටපත් 05 අයත් සහ 3 කාණ්ඩයට ඉදිරිපත්වන අදාල පළාතේ පාසල් නියෝජනයෙන්
- ජාතික උළෙල: — පළාත් වටයේ දී ප්‍රථම ස්ථානයට පත් වූ හෝ සෘජුව ම අවසාන වටයට කැඳවන පාසල් නියෝජනයෙන් සහ 1 කාණ්ඩයේ ඒ ඒ නාට්‍ය ශීර්ෂයන් අතරින් කලාත්මක හා ගුණාත්මක ප්‍රමිතිය අතරින් ඉහළම මට්ටමේ පවතින බවට ජූරියේ විශේෂ නිර්දේශය මත එක් ශීර්ෂයකින් තෝරා ගන්නා පාසල් දෙකක නියෝජනයෙන් (එක් එක් ශීර්ෂයක් සඳහා පළාතකින් එක බැගින් නාට්‍ය 09ක් සහ ජූරියේ විශේෂ නිර්දේශිත නාට්‍ය 02ක් වශයෙන් උපරිම නාට්‍ය 11කි).

6.2. 1 කාණ්ඩයට අයත් සියලු නාට්‍ය හා 3 කාණ්ඩයට අයත් භූමිකා රංගන පළාත් උළෙල සඳහා ඉදිරිපත් විය යුතු අතර එයින් ජාතික උළෙල සඳහා සුදුසුකම් ලබා ගත යුතු වේ.

6.3. නිර්මාණවල ගුණාත්මක භාවය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන් ම දුර්වල පිටපත් නිෂ්පාදනය කිරීම මගින් සිදු විය හැකි ද්‍රව්‍යමය, හා මූල්‍යමය සම්පත් හානිය වලක්වා ඒවා වඩාත් සඵලදායී නිර්මාණාත්මක ප්‍රයත්නයන් කෙරෙහි යෙදවීමට අවකාශ සැලසීම සඳහා, 1 කාණ්ඩයට අයත් නම් කරනු ලබන ශීර්ෂ සඳහා පිටපත් ඇගයීම විනිශ්චය වටයක් ලෙස පැවැත්වෙනු ඇත. එම ශීර්ෂවලට යම් පළාතකින් අයදුම් කර ඇති පිටපත්වලින් හොඳම පිටපත් 05 හි නිෂ්පාදන පමණක් පළාත් ඇගයීම සඳහා තෝරා ගැනේ. එසේ තෝරා **නොගන්නා** පිටපත්වල පිටපත් රචකයන් සඳහා පිටපත් රචනය සඳහා විශේෂ වැඩසටහනක් උළෙලේ අවසන් වටයෙන් පසුව එම වසර තුළ පවත්වා එම පිටපත සංවර්ධනය කිරීමට හෝ නව පිටපතක් ඉදිරි වසර සඳහා රචනය කිරීමට අවශ්‍ය ප්‍රතිපෝෂණය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලැබේ.

6.4 1 කාණ්ඩයේ කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම (1.5.1 ශීර්ෂය) පළාත් උළෙල සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන්නේ, ඒ සඳහා පූර්ව කොන්දේසිය වන, 1 කාණ්ඩයේ නාට්‍ය නිෂ්පාදනය පළාත් උළෙළ සඳහා වේදිකා ගත කරන්නේ නම් පමණි. යම් හෙයකින් එම නාට්‍ය නිෂ්පාදනය ඉදිරිපත් නොකරන්නේ නම් උක්ත 1.5.1 ශීර්ෂයට ද ඉදිරිපත් විය නොහැකි ය.

6.5 3 කාණ්ඩයේ භූමිකා රංගන හා කතා පුවත් ඉදිරිපත් කිරීම පළාත් උළෙල සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන්නේ, ඒ සඳහා පූර්ව කොන්දේසිය වන, 1 කාණ්ඩයේ නිර්මාණය පළාත් උළෙළ සඳහා ද 2 කාණ්ඩයේ නිර්මාණ ජාතික උළෙල 1 වටය සඳහා ද වේදිකා ගත කරන්නේ නම් පමණි. යම් හෙයකින් 1 හෝ 2 කාණ්ඩයේ නිර්මාණය ඉදිරිපත් නොකරන්නේ නම් 3 කාණ්ඩය සඳහා ද ඉදිරිපත් විය නොහැකි අතර ඉදිරිපත් කෙරුණු භූමිකා රංගන ද ඉවත් කරනු ලැබේ.

6.6 2 කාණ්ඩයට අයත් නාට්‍ය සෑජුව ම ජාතික උළෙල සඳහා පමණක් ඉදිරිපත් විය යුතු වේ. යම් පළාතකින් මෙම කාණ්ඩයේ ඒ ඒ ශීර්ෂයන්ට ඉදිරිපත් වන අයදුම්පත් විශාල සංඛ්‍යාවක් වේ නම් එක්කෝ ඒවා අදාල පළාත පාදකව ඇගයීමට ලක් කිරීමෙන් අනතුරුව ජාතික මට්ටමින් සලකා බැලෙනු ඇත: නැතහොත් අදාල ශීර්ෂයේ සමස්ත සහභාගීත්වය සහ සංවිධානාත්මක සාධක විසින් ඉඩකඩ සලසා දෙනු ලබන ආකාරය අනුව පොදුවේ ඇගයීමට ලක් කෙරෙනු ඇත.

6.7 යම් නාට්‍ය ශීර්ෂ සඳහා අයදුම් කොට ඇති ස්වභාවය අනුව යම් ශීර්ෂයක් හෝ ශීර්ෂ කිහිපයක් සඳහා තදාසන්න පළාත් දෙකක හෝ කිහිපයක පළාත් ඇගයීම්, එක් ස්ථානයක වේදිකාගත කොට වෙන් වෙන් වශයෙන් පළාත් පාදකව ඇගයීමට ලක් කිරීමට වුව ද කටයුතු යෙදිය හැක.

6.8 පළාත් උළෙල අදාල පළාත භාර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ එක්ව සංවිධානය කළ යුතු අතර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට සහය වීම පළාතේ සෞන්දර්ය හෝ නාට්‍ය හා රංග කලා විෂය භාර අධ්‍යක්ෂවරයාගේ හෝ අධ්‍යක්ෂවරියගේ වගකීම වේ.

6.9 පළාත් උළෙලට ඉදිරිපත් කළ සිසුන්ම එකී ශීර්ෂවලින් සමස්ත ලංකා මට්ටමට ද පෙනී සිටීම අනිවාර්ය වේ. මේ සම්බන්ධයෙන් නොවැලැක්විය හැකි යම් ගැටලුවක් පළාත් උළෙල මට්ටමේ දී මතු වුවහොත්, මෙහි කොන්දේසි උල්ලංඝනය නො වන පරිදි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේත්, සමස්ත ලංකා මට්ටමේ දී මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේත් උපදේශකත්වය හා පූර්ව ලිඛිත අනුමැතිය මත පමණක් එම ගැටලුව නිරාකරණය කර ගත යුතු ය.

6.10 ජාතික උළෙල, අදියර දෙකක දී පැවැත්වෙනු ඇත. මේ අනුව එහි පළමු අදියර **2017 ජූනි මස 10 සහ 11 දෙ දින ද**, එහි දෙවන අදියර **2017 ජූලි මස 15 සහ 16 දෙ දින ද**, පැවැත්වේ.

6.11 සෑම උළෙල අවස්ථාවක දී ම සිසුන් ඉදිරිපත් කළ යුත්තේ උළෙලට ඉදිරිපත්වන පාසලේ විදුහල්පතිගේ අනුමැතිය මත පමණක් වන අතර ආනුෂංගික අංගවල ශිල්පීය අවශ්‍යතාවන් සඳහා වෙනත් පාසලකින් සිසුන් හෝ ගුරුවරුන් යොදවා ගැනීමේ දී ද අදාල විදුහල්පතිවරුන්ගේ අන්‍යෝන්‍ය එකඟතාවය හා අනුමැතිය මත එය සිදුවිය යුතු ය.

6.12 ඒකල, යුගල හෝ සමූහ ශීර්ෂයකට සහභාගී වන යම් සිසුවකු, සිසුවියක හෝ එම අංගය පුහුණු කිරීමට දායක වූ ගුරු භවතෙකු අයත් පාසලක් පළාත් මට්ටමට පෙනී සිට සමස්ත ලංකා මට්ටමට සුදුසුකම් ලබා ඇති අවස්ථාවක දී, සමස්ත ලංකා අවස්ථාව පැවැත්වීමට පෙර එම සිසුවාට, සිසුවියට හෝ ගුරු භවතාට වෙනත් පාසලකට ඇතුළත් වීමට හෝ ස්ථාන මාරු වීමට සිදු වූ විටෙක, මෙම වසර සඳහා පමණක් තමා මුලින්ම පළාත් මට්ටමට පෙනී සිටි පාසල නියෝජනය කිරීමට ඉඩ ලබා දිය යුතු වේ.

## 7. නාට්‍ය පෙළ හා අන්තර්ගතය

7.1 කවර මූලාශ්‍රයක් පදනම් කොට ගත්ත ද සියලුම නාට්‍ය පෙළ රචනා ස්වතන්ත්‍ර නිර්මාණ විය යුතුය. (ශීර්ෂ අංක 2.1.1, 2.1.2, 2.2.1, 2.2.2, 2.2.3, 2.2.4 සහ 2.3.1 හැර).

7.2 මෙම උළෙල සඳහා නිර්මාණය කරන සහ නිෂ්පාදනය කරන නාට්‍යවල තේමා / කතා වස්තූන් / ගී පද මාලා / දෙබස් / නාට්‍ය පෙළ ආදිය ජාති, ආගම්, කුල භේදවලට හා වෙනත් සමාජ විරෝධී අරමුණුවලට තුඩු නොදෙන එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතු අතර, එවන් අදහස් ගම්‍ය වන පරිදි අර්ථකථනය නො කළ යුතු ද වේ. තවද, තමන් අයත් වන හෝ නියෝජනය කරන ජාති, ආගම්, සංස්කෘතික හා දේශපාලනික මතිමතාන්තර හේතුකොටගෙන කිසියම් සමාජ කොට්ඨාසයක් අපහසුවට ලක් විය හැකි ආකාරයේ ඉදිරිපත් කිරීම්වලින් වැලකිය යුතු ය.

7.3 සියලු නිර්මාණයන් පාසල් සිසුනට උචිත, පාසල් පද්ධතියේ පිළිගත් වටිනාකම් හා නො ගැටෙන ඒවා විය යුතු අතර අවර ගණයේ භාෂා ව්‍යවහාරයන්ගෙන් තොර විය යුතු ය. ශීර්ෂ අංක 2.1.1, 2.1.2, 2.2.1, 2.2.2, 2.2.3, 2.2.4 සහ 2.3.1 හි ශීර්ෂයන්ට අදාළ පෙළ තෝරා ගැනීමේ දී ද, ඉහත කරුණු පිළිබඳව බෙහෙවින් සැලකිලිමත් විය යුතු වේ.

7.4 අන්තර්ගතය අතින් ඉහත කොන්දේසි හා අනුකූල නො වන නාට්‍ය පිටපත් පළමු වටයේ දී ම උළෙලින් ඉවත් කරනු ලැබේ.

7.5 1 කාණ්ඩයේ නාට්‍ය නිෂ්පාදනවල දී අදාල පාසලේ විදුහල්පති, ගුරුභවතකු හෝ ශිෂ්‍යයකු විසින් නාට්‍ය පිටපත රචනා කළ යුතුය.

## 8. ඇගයීම

8.1 පිටපත් වටය, පළාත් වටය සහ සමස්ත ලංකා උළෙල යන මට්ටම්වල නාට්‍ය ඇගයීම සඳහා ඇගයීම් මණ්ඩල, ශ්‍රී ලංකා කලා මණ්ඩලයෙහි රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය විසින් නිර්දේශිත, ප්‍රවීණ සම්පත්දායක සංචිතයක් අතරින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පත් කෙරෙනු ඇත.

8.2 නාට්‍ය නිෂ්පාදනයක් ඇගයීම යනු එක් නිර්මාණයක් ඇතුළත එකිනෙකට වෙනස් ක්ෂේත්‍රයන් 10ක් පමණ සුවිශේෂ වශයෙන් සැලකිල්ලට ගෙන ඇගයීමට සිදුවන සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් මෙම උළෙලේ කිසිදු අවස්ථාවක දී ඇගයීම් මණ්ඩල සහ ඇගයීම් ක්‍රියාවලිය ගණිතමය / සංඛ්‍යාත්මක සාධක මත පදනම් නොකෙරේ. ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ අවශ්‍යතාවන් පාදකව, ජාතික වටයේ දී අවම වශයෙන් තුනත් උපරිම වශයෙන් හයත් අතර සංඛ්‍යාවකින් යුතුව ඇගයීම් මණ්ඩල පත් කෙරෙන අතර, යම් ශීර්ෂයකට පත් කෙරෙන ඇගයීම් මණ්ඩලය ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය එකඟතාව මත ලබා දෙන ඇගයීම පමණක්, අවසාන විනිශ්චය වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් භාර ගනු ලැබේ.

8.3 භූගෝලීය වශයෙන් මෙරට නාට්‍ය කලාවේ විෂම ව්‍යාප්තිය අනුව, සහ රජය විසින් පවත්වන අන් සියලු ප්‍රධාන පෙළේ නාට්‍ය උළෙලවල සහ තරගවල අනුගමනය කෙරෙන ක්‍රියාවලිය අනුව, මෙම උළෙලේ ද පළාත් ඇගයීම එක් පොදු ඇගයීම් මණ්ඩලයක් මගින් සිදු කෙරේ. පළාත් ඇගයීමට ලක් කෙරෙන 1 හා 3 කාණ්ඩයේ සියලු නිර්මාණ ඒවායේ ගුණාත්මක මට්ටම අනුව පහත පරිදි ශ්‍රේණිගත කෙරේ. ජාතික අදියරට පෙර වඩාත් හොඳින් තම නිර්මාණය සකස් කර ගැනීම දිරි ගැන්වීම සඳහා මෙම වර්ගීකරණය සිදු කෙරෙන අතර, A ශ්‍රේණියට අයත් නිර්මාණයක අන්තර්ගත විය යුතු ප්‍රමිතිය පිළිබඳ යම් මග පෙන්වීමක්, www.moe.gov.lk දරන අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි මාර්තු මාසය ආරම්භයේ දී ප්‍රසිද්ධියට පත් කෙරේ.

A ශ්‍රේණිය - හොඳ නිෂ්පාදනයකි
B ශ්‍රේණිය - සාමාන්‍ය මට්ටමේ නිෂ්පාදනයකි
C ශ්‍රේණිය - දුර්වල නිෂ්පාදනයකි

8.4 පළාත් මට්ටමේ දී අංග රචනය, රංග වස්ත්‍රාභරණ සහ පසුතල නිර්මාණය යන ආනුෂංගික අංග ඇගයීමට බඳුන් නො කෙරේ. ජාතික උළෙලට තේරී පත්වන හෝ ඉදිරිපත්වන නාට්‍ය අංග, එයට ඉදිරිපත් කිරීමේ දී නිර්මාණයට අදාළව ආනුෂංගික අංග භාවිත කළ යුතුය.

8.5 මෙම උළෙලේ ඇතැම් ශීර්ෂයන් කිහිපයක් සඳහා අවශ්‍යනම් පටිගත කළ සංගීතය භාවිතයට හා ශබ්ද සංයෝජනයන් භාවිතයට ඉඩ ලබා දේ. එහෙත් එම සංගීත, ශබ්ද සංයෝජන උපාංගයන් සඳහා නාට්‍ය වේදිකාගත කෙරෙන ශාලාවල විදුලිය සැපයුමෙන් විදුලිය සැපයීමට උළෙල සංවිධායකයන් බැඳී නොමැති බැවින් අදාල පාසල් විසින් යෝග්‍ය විකල්පයන් සොයා ගත යුතු ය.

8.6 නාට්‍යවල ගින්දර භාවිතය තහනම් වන අතර වේදිකා ආලෝක උපකරණ ගෙනැවිත් සවි කිරීම හෝ ධූම යන්ත්‍ර භාවිතය ද සපුරා තහනම් ය.

8.7 **ජාතික වටයේ දී පසුතලයක් සවි කිරීම සහ සවි කොට තිබූ පසුතලයක් ඉවත් කිරීම විනාඩි 10ක කාලයක් තුළ සිදු කළ යුතු ය. යම් ශීර්ෂයක ප්‍රථමයෙන් ඉදිරිපත් වන පාසල ද පසුතලය සවි කළ යුත්තේ ඇගයීම් මණ්ඩලය අසුන් ගත් පසුව ඔවුන් ඉදිරිපිට දී ය.**

8.8 **මේ සෑම අවස්ථාවක දීම ප්‍රධාන තිරය විවෘතව තබා ඇගයීම් මණ්ඩලයට සහ අන් සැමට පෙනෙන පරිදි පසුතල සවි කිරීම සහ ඉවත් කිරීම සිදු කළ යුතු ය. දී ඇති කාල සීමාව තුළ ඉතා පහසුවෙන් සවි කළ හැකි අයුරින් ද, ආරක්ෂිතව නාට්‍යය තුළ භාවිත කළ හැකි අයුරින් ද සහ අවසානයේ දී ඉතා කඩිනමින් ගලවා ඉවත් කළ හැකි අයුරින් ද පසුතලය සකස් කිරීමේ නිර්මාණාත්මක අභියෝගය අදාල විදුහල සතු වේ. අදාල කාල සීමාව තුළ ඉවත් කර නොගන්නා සහ සවි කර නොගන්නා පසුතලයන් පසුතල නිර්මාණ ඇගයීමෙන් ඉවත් කරනු ලැබේ.**

8.9 ඕනෑම උළෙල අවස්ථාවට ඉදිරිපත් වන නාට්‍ය ඇගයීමේ දී, 3 කාණ්ඩයේ ශීර්ෂයන් සඳහා හැර අන් සියලු ශීර්ෂයන්ට අයත් නාට්‍ය වේදිකා ගත කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුත්තේ, නාට්‍යයක් වේදිකා ගත කිරීම සඳහා යෝග්‍ය ප්‍රොසීනියම් වේදිකාවක් සහිත **රංග ශාලාවක් තුළ** පමණි.

8.10 ඕනෑම උළෙල අවස්ථාවක දී වුව ද, එකකට වඩා වැඩි ඇගයීම් මණ්ඩල සංඛ්‍යාවක නාට්‍ය ඇගයීමේ කටයුතු සිදු කෙරෙන්නේ නම් එම ඇගයීමේ මණ්ඩලවල පිහිටීම හා අදාල මණ්ඩලවලට ඉදිරිපත් කෙරෙන ශීර්ෂයන් පිළිබඳව තොරතුරු ඇතුළත් කාල සටහනක් කල් තබා අදාල පාසල් වෙත ලිඛිතව ලබා දීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු ය.

8.11 කිසිදු ශීර්ෂයක් සඳහා සම ස්ථාන ලබා නො දේ. ප්‍රථම ස්ථානයට සහ ජූරියේ නිර්දේශයන්ට අතිරේකව, පළාතකින් යම් ශීර්ෂයකින් අමතර නාට්‍ය සමස්ත ලංකා මට්ටමට තෝරා නොගැනේ.

8.12 අවශ්‍ය සාධන මට්ටමට ළඟා වී නොමැති බවට ඇගයීම් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නාට්‍ය හෝ නාට්‍ය අංග, පළාත් මට්ටමින් ජාතික මට්ටමට හෝ ජාතික මට්ටමේ සම්මානයන් සඳහා තෝරා නො ගනු ඇත.

8.13 මෙහි ශීර්ෂ යටතේ දක්වා ඇති කොන්දේසි අතර ඇති කාලයට, සහභාගී විය හැකි පුද්ගල සංඛ්‍යාවට සහ සහභාගී විය හැකි ශ්‍රේණි පරාසයන්ට අදාල කොන්දේසීන්ගෙන් එකක් හෝ කිහිපයක් උළෙලේ ඕනෑම අවස්ථාවක දී උල්ලංඝනය වූ විටෙක එම වැරදි සඳහා දරුවන්ට වන්දි ගෙවීමට ඉඩ තබනු නොලැබේ. තම නිර්මාණය චක්‍රලේඛයට අනුකූලව ඉදිරිපත් කිරීම නිර්මාණයට දායක වන ගුරුභවතුන්ගේ සාමූහික වගකීමක් වන බැවින් අදාල ශීර්ෂයෙන් එම විදුහල නියෝජනය කළ සියලුම ගුරු භවතුන්ගේ සහතික අයිතිය අවලංගු කරනු ලැබේ.

8.14 ඉහත කරුණුවලට අදාලව යම් වංචනික ක්‍රියාවක් සිදුව ඇතැයි උළෙලෙහි මොනයම් අවස්ථාවක දී හෝ උළෙලට පසුව හෝ අනාවරණය වුවහොත්, වගකිවයුතු ගුරු භවතුන්ට එරෙහිව විනය කාර්ය පරිපාටිය අනුව කටයුතු කොට, ඉදිරි කිසිදු අවස්ථාවක දි පාසල් පද්ධතිය නියෝජනය කරමින් කිසිදු උළෙලකට හෝ තරගයකට නාට්‍ය ඉදිරිපත් කිරීමේ අයිතිය අහෝසි කිරීම ඇතුළුව නිර්දේශිත අනෙකුත් විනය පියවරයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

8.15 කාල සටහනේ තමන්ට නියමිත කාලයට පෙර අදාල ඇගයීම් මණ්ඩලය පිහිටි විදුහල වෙත පැමිණ සූදානම් වී, කාල සටහන අනුව සංවිධායක මන්ඩලය විසින් තම නිර්මාණය වේදිකා ගත කිරීමට කැඳවා සිටින වේලාවට පෙර ලියාපදිංචි වීම අදාල විදුහලේ වගකීමකි. කාල සටහනට අනුව තම විදුහලට නිශ්චිත වශයෙන් ලබා දී ඇති වේලාවට අදාල මණ්ඩලයට වාර්තා නො කළ ඕනෑම පාසලක් උළෙලට සහභාගී නො වූ සේ සලකා කටයුතු කෙරෙනු ඇත.

8.16 ජාතික වටය සඳහා සහභාගීවන පාසල්වලට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නේවාසික පහසුකම් ලබා නො දේ. නේවාසික පහසුකම් අවශ්‍ය පාසල්වලට පහසුවක් වශයෙන්. එම පහසුකම් ලබා ගත හැකි පාසල් පිළිබඳව තොරතුරු ලබා දීම පමණක් සිදු කෙරේ.

8.17 ජාතික හා පළාත් ප්‍රතිඵල, අදාල වටය පවත්වන දිනයේදීම ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**9. විනය**

9.1 එක් එක් අවස්ථාවට සහභාගී වීම සඳහා මධ්‍යස්ථානවලට කැඳවාගෙන එන සිසුන්ගේ ආරක්ෂාව, හැසිරීම, විනය හා භාරකාරත්වය පිළිබඳව විදුහල්පතිවරුන්ගේ සහ කණ්ඩායම් භාර ගුරුවරුන්ගේ විශේෂ අවධානය යොමු විය යුතුය.

9.2 සිසුන්ගේ භාරකාරත්වය ගුරුමහතුන්ට ද, සිසුවියන්ගේ භාරකාරත්වය ගුරුමහත්මීන්ට ද පැවරේ.

9.3 කිසියම් අයථා සිදුවීමක් සිදුවුවහොත් ඒ සඳහා භාරකරුවන් වගකීමට බැඳේ. උළෙල හා සම්බන්ධ කිසිදු අවස්ථාවක් සඳහා දෙමාපියන් සහභාගි කර නොගත යුතුය.

9.4 **මෙම උළෙල සඳහා අයදුම් කොට ඉදිරිපත්වන සියලුම පාසල් හා අනෙකුත් අදාල පාර්ශවකරුවන් උළෙලේ සෑම අවස්ථාවක දීම මෙහි සඳහන් සියලුම නීති රීති හා විධිවිධාන අනිවාර්යයෙන්ම පිළිපැදිමට බැඳී සිටින බවටත්, ඇගයීම් මණ්ඩලයේ තීරණය කොන්දේසි විරහිතව පිළිගැනීමට බැඳී සිටින බවටත් සලකනු ලැබේ.**

9.5 **යම් පාසලක් අයදුම්පත් එවීමේ දී ම විනිශ්චය පිළිගැනීමට බැඳී සිටින බැවින් විනිශ්චය පිළිබඳ අභියාචනා ඉදිරිපත් නො කළ යුතු අතර එවන් අභියාචනා භාර නොගැනේ.**

9.6 සංවිධාන කටයුතුවලට බාධා පැමිණෙන අයුරින් හෝ වෙනත් නුසුදුසු ක්‍රියාවන් සිදුකරමින් හෝ හැසිරෙන ගුරුවරුන් හා සිසුන් වෙතොත් ඔවුන් සඳහා විනයානුකූලව පියවර ගනු ලැබේ.

9.7 මෙම උළෙලේ මොනම අවස්ථාවකදීවත් තම පාසලේ කටයුතු ආවරණය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසරයෙන් තොරව ජනමාධ්‍යවේදීන් හෝ ඡායාරූප ශිල්පීන් කැඳවාගෙන ඒම තහනම් වේ.

9.8 **අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජකාරියක් වන මෙම උළෙලේ සෑම අවස්ථාවක දී ම යම් විදුහලක් ආශ්‍රිතව රාජකාරි ගනුදෙනු සිදු විය යුත්තේ අදාල විදුහලේ විදුහල්පතිවරයාත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් සෞන්දර්ය අධ්‍යක්ෂවරයාත් අතර පමණි. තම පාසලේ වෙනත් පාර්ශවයන් එම රාජකාරි ගනුදෙනුවලට මැදිහත් නොකරගත යුතු අතර, අධ්‍යාපන පද්ධතියෙන් පරිබාහිර පාර්ශවයන් මෙම රාජකාරි කටයුතු සඳහා මැදිහත් කර නොගැනීමේ වගකීම ද අදාල පාසලේ විදුහල්පති වෙත සෘජුවම පැවරේ.**

9.9 ජාතික උළෙල අදියරවල කාල සටහන් ලබා දීම, කොළඹ දී පැවැත්වෙන පූර්ව උපදෙස් රැස්වීමක දී සිදු කෙරෙනු ඇති බැවින් ඊට සහභාගී වීම අනිවාර්ය වේ. එම රැස්වීමේ දී ලබා දෙන "විදුහල්පති විශේෂ ප්‍රකාශය" නම් ආකෘති පත්‍රය සම්පූර්ණ කර විදුහල්පතිගේ අත්සන සහිතව නාට්‍යය ඉදිරිපත් කරන අවස්ථාවේ දී ලබා නොදෙන පාසල්වලට නාට්‍ය වේදිකාගත කිරීමට ඉඩ ලබා නො දේ.

9.10 **පාසලකට මෙම උපදෙස් පරිශීලනය කිරීමට නොහැකි වීම හෝ නොකිරීම නිදහසට කරුණක් නොවේ. ඉන් දරුවන්ට සිදුවිය හැකි හානි, නොසැලකිලිමත් බවේ හා වගකීම් විරහිත බවේ ප්‍රතිඵලයක් සේ සලකා අදාල වගකිව යුතු පාර්ශවයන්ට විරුද්ධව පියවර ගනු ලැබේ.**

**10. අනන්‍යතාව තහවුරු කිරීම**

10.1 අනන්‍යතාව තහවුරු කිරීමට අවශ්‍ය වූ විටෙක සෑම සහභාගීවන්නෙකුම පිළිගත් හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීමට, සෑම අවස්ථාවකදීම සූදානමින් සිටිය යුතුය.

10.2 ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා පමණක් විදුහල්පතිවරයා සහතික කළ ශිෂ්‍ය නාමලේඛනයක් අනන්‍යතා සහතිකයක් ලෙස පිළිගැනේ.

10.3 ජාතික හැඳුනුම්පත හෝ තැපැල් හැඳුනුම්පත නොමැති සිසුන්ගේ අත්සන සහිත ඡායාරූපය අදාළ විදුහල්පති විසින් අත්සන් කොට අදාල කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ කලාපයේ සෞන්දර්ය හෝ වෙනත් විෂය අධ්‍යක්ෂවරයකු හො අධ්‍යක්ෂවරියක විසින් සහතික කොට තිබිය යුතුය.

10.4 අනන්‍යතාව තහවුරු කිරීමට අපොහොසත් වන්නන් උළෙලෙන් ඉවත් කිරීමට සිදුවනු ඇත.

## 11. කුසලතා සම්මාන සහ සහතික පත් පිරිනැමීම

11.1 පළාත් මට්ටමින් ජයග්‍රහණය ලබා ගන්නා සිසුනට සහතික පත්‍ර පිරිනැමීමේ වැඩ පිළිවෙලක් පළාත් මට්ටමෙන් යොදා ගතයුතුය. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා මෙම අමාත්‍යාංශය මගින් සහතික පත්‍ර පිරිනමනු ලැබේ.

11.2 ඒ ඒ ශීර්ෂයන්හි සුවිශේෂතාවයන්ට අදාල වන පරිදි පහත අංගයන් සඳහා සහතික පත්‍ර පිරිනැමේ.

- හොඳම නිෂ්පාදනය 1, 2 හා 3 ස්ථාන
- හොඳම අධ්‍යක්ෂණය
- හොඳම නාට්‍ය පෙළ රචනය (කතා පුවත් ඉදිරිපත් කිරීම් හැර 1 කාණ්ඩයේ අනෙකුත් නාට්‍ය සඳහා)
- හොඳම භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යයා 1, 2 හා 3 ස්ථාන (1 හා 2 කාණ්ඩ සඳහා)
- හොඳම භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යාව 1, 2 හා 3 ස්ථාන (3 කාණ්ඩය හැර)
- හොඳම අංග රචනය (1 කාණ්ඩයේ කතා පුවත් ඉදිරිපත් කිරීම් සහ 3 කාණ්ඩය හැර)
- හොඳම රංග වස්ත්‍රාභරණ නිර්මාණය (1 කාණ්ඩයේ කතා පුවත් ඉදිරිපත් කිරීම් සහ 3 කාණ්ඩය හැර)
- හොඳම වේදිකා පසුතල නිර්මාණය (1 කාණ්ඩයේ කතා පුවත් ඉදිරිපත් කිරීම් සහ 3 කාණ්ඩය හැර)
- හොඳම සංගීත නිර්මාණය / හොඳම සංගීත - ශබ්ද සංයෝජනය (1 කාණ්ඩයේ කතා පුවත් ඉදිරිපත් කිරීම් සහ 3 කාණ්ඩය හැර)
- හොඳම රංග වින්‍යාසය (1 කාණ්ඩයේ කතා පුවත් ඉදිරිපත් කිරීම් සහ 3 කාණ්ඩය හැර)
- හොඳම වේදිකා පරිපාලනය (1 කාණ්ඩයේ කතා පුවත් ඉදිරිපත් කිරීම් සහ 3 කාණ්ඩය හැර)
- හොඳම භූමිකා රංගනය/කතා පුවත් ඉදිරිපත් කිරීම 1,2,3 ස්ථාන (3 කාණ්ඩය සඳහා)
- ඇගයීම් මණ්ඩලයේ විශේෂ කුසලතා ඇගයීම්

11.3 භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යයා සහ ශිෂ්‍යාව තෝරා ගැනීමේ පදනම වනුයේ නිරූපිත භූමිකාවේ ස්ත්‍රී/පුරුෂ භාවය නො ව, නළුවාගේ/නිළියගේ ස්ත්‍රී/පුරුෂ භාවය ය.

මෙම උපදෙස් සංග්‍රහයෙහි සඳහන් ඕනෑම කරුණක් ආශ්‍රිත අවසාන තීරණය රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු ය.

# උළෙලශීර්ෂ

## 1 කාණ්ඩය – කෙටි නාට්‍ය නිෂ්පාදන

### 1.1. ළමා තේමාත්මක නාට්‍ය

**ළමා ලෝකය තේමා කොටගත් සහ ළමා ප්‍රේක්ෂාගාරයක් අරමුණු කොටගත් නාට්‍ය නිර්මාණයක් විය යුතු ය. එය ළමයාගේ වයස හා බුද්ධියට යෝග්‍ය වන ලෙස සකස් වූ නිර්මාණාත්මක වූ ද, සෞන්දර්යාත්මක වූ ද ක්‍රියාකාරකමකි. විවිධ වයස්වල ළමයින් සහභාගී කරගනිමින් ඔවුන්ට පොදුවේත්, පෞද්ගලිකවත් රස විඳිය හැකි, පාසල් පද්ධතියට ගැලපෙන්නා වූ සාමූහික නිර්මාණයන් මෙ මගින් අපේක්ෂිත ය.**

**1.1.1 විවෘත අංශය**

- 1 සිට 13 ශ්‍රේණිය දක්වා සිසු සිසුවියන්ට සහභාගී විය හැකි ය.
- ළමා ප්‍රේක්ෂාගාරයක් අරමුණු කොටගෙන නිර්මාණය කළ යුතු ය.
- රංගනයට සහභාගි විය හැකි සංඛ්‍යාව නිර්මාණයට උචිත පරිදි තීරණය කළ හැකිය.
- නාට්‍ය නිර්මාණය සඳහා සුදුසු ශෛලියක් යොදා ගත හැකිය.
- සජීවී සංගීතය පමණක් භාවිත කළ හැකි ය.
- කාලය උපරිම විනාඩි 25 ක් විය යුතුය.

### 1.2. කෙටි නාට්‍ය

**නාට්‍යය රඟ දැක්වීමේ කාලය කෙටි වීමේ අරුතින් කෙටි නාට්‍ය ලෙස කිසි සේත්ම නොගැනෙන මෙම නිර්මාණාත්මක ප්‍රවේශයේ දී, ජීවිතය තුළින් උකහා ගත හැකි අනේකවිධ අත්දැකීම් හා නාට්‍යමය අවස්ථාවන්, අතිශයින් ප්‍රබල සහ සාරසංක්ෂිප්ත නාට්‍යමය අත්දැකීම් ලෙස කලාත්මකව ප්‍රකාශ වීමක් අපේක්ෂා කෙරේ.**

**1.2.1 ජ්‍යෙෂ්ඨ**

අංශය: **ස්වතන්ත්‍ර කෙටි නාට්‍ය**

- ස්වතන්ත්‍ර නාට්‍ය පිටපතක් විය යුතු ය.

**1.2.2 ජ්‍යෙෂ්ඨ ද්විතියික ද්විතියික අංශය: සාහිත්‍යමය මූලාශ්‍ර පාදක කෙටි නාට්‍ය – දේශීය කෙටි කතා**

- දේශීය කෙටි කතාවක් මත පදනම් විය යුතු. (විදේශීය කෙටි කතාවක දේශීය පරිවර්තනයක් හෝ අනුවාදයක් භාවිත කළ නො හැකිය)
- පාදක කෙටි කතාවේ ආඛ්‍යානය ඒ ආකාරයෙන්ම ප්‍රතිනිෂ්පාදනය කරන ආකාරයේ නාට්‍යයක් බවට පත් කිරීමක් අපේක්ෂා නොකෙරේ.
- පාදක කෙටි කතාවේ අනුවාදයක් වුව ද ගැටලුවක් නැත. එහෙත් මුල් කෙටි කතාවේ අර්ථයට හානි නොවිය යුතු ය.
- අයදුම්පත සමග මුල් කෙටි කතාවේ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

**ඉහත නාට්‍ය සඳහා පොදු කොන්දේසි**

- ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශයේ සිසු සිසුවියන්ට සහභාගී විය හැකි ය. නාට්‍යයේ පෙළ විසින් ඉල්ලා සිටිනු ලැබෙන සුවිශේෂ අවස්ථාවක දී ඉහත පොදු නීතිරීතිවල 2.1 කොන්දේසිය අදාල වේ.
- කාලය උපරිමය විනාඩි 25 කි.
- පාසල් සිසුන්ට උචිත, ඒකීය රංග වින්‍යාසයක් පාදක කොට ගත හැකිය.
- රංගනයට සහභාගි විය හැකි සංඛ්‍යාව නිර්මාණයට උචිත පරිදි තීරණය කළ හැකිය.
- සුදුසු ශෛලියක් නාට්‍ය නිර්මාණය සඳහා යොදා ගත හැකිය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

### 1.3. විශ්ව ළමා සාහිත්‍ය පාදක නාට්‍ය

**යෝජිත විශ්ව සාහිත්‍යකරුවකුගේ ළමුන්ට යෝග්‍ය කතාවක් හෝ සුරංගනා කතාවක් පාදක කර ගනිමින්, ළමුන්ට මෙන්ම වැඩිහිටියන්ට ද එක සේ රස විඳිය හැකි සේ නිර්මිත නාට්‍ය නිෂ්පාදනයක් විය යුතු ය. ළමා**

නාට්‍ය වශයෙන් දැනට මෙරට ප්‍රචලිතව පවත්නා නාට්‍ය වර්ගයට වඩා සෑම අතකින්ම නිර්මාණශීලී, අතිශයින්ම නාට්‍යානුසාරී සහ නැවුම් කලාත්මක මැදිහත්වීමක් මින් අපේක්ෂිත ය.

**1.3.1 විවෘත අංශය**

- කාලය උපරිමය විනාඩි 25 කි.
- 1 සිට 13 ශ්‍රේණිය දක්වා සිසු සිසුවියන්ට සහභාගී විය හැකි ය.
- 2017 වසර සඳහා යෝජිත සාහිත්‍යකරුවා/ සාහිත්‍යකරුවන්: ග්‍රිම් සහෝදරයන් (ජර්මනිය)
- ග්‍රිම් සහෝදරයන්ගේ ඕනෑම කථාවක් පාදක කර ගත හැකිය.
- අයදුම්පත සමග මුල් කතාවේ පිටපතක් (ඉංගීසි හෝ සිංහල මාධ්‍යයෙන්) ඉදිරිපත් කළ යුතු ය.
- රංගනයට සහභාගි විය හැකි සංඛ්‍යාව නිර්මාණයට උචිත පරිදි තීරණය කළ හැකිය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

## 1.4. විදේශීය නාට්‍යයක් ඇසුරින් අනුවාදිත නාට්‍ය

**විදේශීය නාට්‍යකරුවකුගේ විශ්ව සම්භාවනාවට පත් දිගු නාට්‍ය කෘතියක් ඇසුරෙන් කෙටි කාල පරාසයක් සඳහා රචිත නාට්‍යයක් ලෙස මෙම නිෂ්පාදනය සිදු කළ යුතු වේ.**

**1.4.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය**

- 2017 වර්ෂය සඳහා යෝජිත නාට්‍යය - **හැම්ලට්** (විලියම් ශේක්ෂපියර්)
- කාලය උපරිමය විනාඩි 25 කි.
- මුල් කෘතියේ චරිත හා ස්ථාන නාමයන් ද ඒ ආකාරයටම භාවිත කළ යුතු ය.
- දෙන ලද රංගන කාල සීමාවට අනුගත කර ගත හැකි වන පරිදි, මුල් කෘතියට හානි නොවන පරිදි සහ මුල් කෘතියේ චරිත හා සිදුවීම් විකෘති නොවන පරිදි සාධාරණ සංස්කරණයක් සිදු කළ හැකි ය.
- නිර්මාණාත්මක අවශ්‍යතාවන් අනුව මුල් කෘතියේ සිදුවීම්, චරිත හෝ ජවනිකා ඉවත් කළ හැකි වුවත්, මුල් කෘතියෙහි නොමැති චරිත හෝ සිදුවීම් ඇතුළත් කළ නොහැක.
- මුල් කෘතියේ හකුළුවන ලද අනුපිටපතක් ඉදිරිපත් කිරීමක් නො ව, මුල් කෘතිය මත පදනම් වූ, ප්‍රබල නාටකීය අත්දැකීමක් ඉදිරිපත් කළ හැකි නව්‍ය නිර්මාණාත්මක මැදිහත් වීමක් මින් අපේක්ෂිත ය.
- රංගනයට සහභාගි විය හැකි සංඛ්‍යාව නිර්මාණයට උචිත පරිදි තීරණය කළ හැකිය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

## 1.5. කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම (Storytelling)

**දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ වෙනත් සුදුසු කතාවක් ආශ්‍රිත කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම**

**1.5.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: සමූහ**

- කැමති ඕනෑම සාම්ප්‍රදායික කතාවක්, එහි චරිත, අවස්ථාවන් නාට්‍යානුසානිරූපණය වන ආකාරයට නාට්‍යානුසාරීව රංගනයෙන් ඉදිරිපත් කළ යුතු ය.
- **දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ වෙනත් සුදුසු කතාවක් තෝරා ගැනීමට නිදහස තිබේ.**
- රංග භාණ්ඩ, රංග වස්ත්‍ර ආදිය භාවිත කිරීමට ඉඩ ඇති අතර ස්ථානීය වශයෙන් භාවිත කළ හැකි මේසයක් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම පසුතල පමණක් භාවිත කිරීමට ඉඩ ඇත.
- ගැහැනු/පිරිමි වශයෙන් වර්ග කිරීමක් නැත.
- උපරිම කාලය විනාඩි 08 කි. අවම කාලය විනාඩි 05කි.
- සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.
- ඉදිරිපත් කරන්නන් 05 දෙනාට පමණක් හැසිරවිය හැකි ආකාරයේ සංගීත/ශබ්ද සංයෝජනයන්ට වුව ද ඉඩ ඇත. මෙහි දී රූකඩ වුව ද භාවිත කිරීමට නිදහස තිබේ.

# 2 කාණ්ඩය – නිර්දේශිත නාට්‍ය ජවනිකා

## 2.1 යෝජිත දේශීය / විදේශීය නාට්‍යවේදීන්ගේ නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

**නම් කරන ලද දේශීය / විදේශීය නාට්‍යවේදීන්ගේ නාට්‍ය ඇසුරෙන් තෝරාගත් නාට්‍යමය කොටස් නිරූපණය කිරීමකි.**

### 2.1.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: 2017 වර්ෂය සඳහා යෝජිත නාට්‍යවේදියා – සුගතපාල ද සිල්වා

- සුගතපාල ද සිල්වා නාට්‍යවේදියා අතින් නිර්මිත නාට්‍යයකින් පාසලට ගැලපෙන ලෙස තෝරාගත් කොටසක් නිරූපණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.
- සංගීත භාවිතය මුල් කෘතියට අනුකූලව සිදු කළ යුතු වේ.

### 2.1.2 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: යෝජිත විදේශීය නාට්‍යවේදීන් – ආතර් මිලර්

- ඇමරිකානු නාට්‍යකරු ආතර් මිලර් විසින් නිර්මිත නාට්‍යයකින් පාසලට ගැලපෙන ලෙස තෝරාගත් කොටසක් නිරූපණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. (අවශ්‍ය නම් අලුතෙන් පරිවර්තනය කරගැනීමට ද බාධාවක් නැත.)
- ලංකාවේ මීට පෙර නිෂ්පාදිත කෘතියක් නම් සංගීත භාවිතය මුල් කෘතියට අනුකූලව සිදු කළ යුතු අතර පරිවර්තනය කරවාගෙන අලුතෙන් නිර්මාණය කරන නාට්‍ය අංගයක් නම්, පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

## 2.2 සංස්කෘත, ග්‍රීක-රෝම හා ශේක්ෂ්පියරියානු නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

### 2.2.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: සංස්කෘත නාට්‍ය

- දැනට සිංහල පරිවර්තනයන් ලෙස පළ කෙරී ඇති, ඕනෑම සංස්කෘත නාට්‍යයකින් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.
- සජීවී සංගීතය පමණක් භාවිත කළ යුතු ය.
- තෝරාගන්නා පෙළ, දැනට සිංහල බසින් නිෂ්පාදනය වී තිබේ නම්, සංගීතය අභිනවයෙන් නිර්මාණය කළ යුතු අතර ගීතවල තනු ස්වාධීන නව්‍ය නිර්මාණ විය යුතු ය.

### 2.2.2 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: ග්‍රීක හා රෝම ඛේදාන්ත නාට්‍ය

- සම්භාව්‍ය ග්‍රීක නාට්‍යයක් තෝරා ගන්නේ නම්, ඊස්කිලස්ගේ **තීබයට එරෙහිව සත් දෙනෙක්** / යුරිපිඩීස්ගේ **ඉලෙක්ට්‍රා** / සොෆොක්ලීස්ගේ **ඊඩිපස්** / සොෆොක්ලීස්ගේ **ඇන්ටිගනී** යන නාට්‍ය අතරින් එකකින් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.
- රෝම ඛේදාන්ත නාට්‍ය තෝරා ගන්නේ නම්, ඕනෑම රෝම ඛේදාන්ත නාට්‍යයකින් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.
- දැනට සිංහල පරිවර්තනයන් වශයෙන් නිකුත් වී ඇති නාට්‍ය කෘතීන් මෙන් ම, මේ වෙනුවෙන් ම සිදු කරන පරිවර්තනයන් ද පාදක කොට ගත හැකි ය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.
- තෝරාගන්නා පෙළ, දැනට සිංහල බසින් නිෂ්පාදනය වී තිබේ නම්, සංගීතය අභිනවයෙන් නිර්මාණය කළ යුතු අතර ගීතවල තනු ස්වාධීන නව්‍ය නිර්මාණ විය යුතු ය.

### 2.2.3 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: ග්‍රීක හා රෝම ප්‍රහසන නාට්‍ය

- සම්භාව්‍ය ග්‍රීක ප්‍රහසන නාට්‍යකරු ඇරිස්ටෝෆනීස්ගේ නාට්‍යයකින් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙම වසර සඳහා අපේක්ෂා කෙරේ.

- දැනට සිංහල පරිවර්තනයන් වශයෙන් නිකුත් වී ඇති නාට්‍ය කෘතීන් මෙන් ම, මේ වෙනුවෙන් ම සිදු කරන පරිවර්තනයන් ද පාදක කොට ගත හැකි ය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

**2.2.4 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: ශේක්ෂ්පියර් නාට්‍ය**

- විලියම් ශේක්ෂ්පියර්ගේ **රෝමියෝ ජුලියට්** නාට්‍යයෙන් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.
- නාට්‍යමය අවස්ථාවන් නිර්මාණය කිරීමේ දී, මෙම චක්‍රලේඛයෙහි අංක 7.2 හා 7.3 වගන්තිවල සඳහන් කරුණු පිළිබඳව විශේෂයෙන් සැලකිළිමත් විය යුතු ය.

## 2.3 මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

**2.3.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය:සරච්චන්ද්‍ර නාට්‍ය- 2017 වර්ෂයට යෝජිත නාට්‍යය: ලෝමහංස**

- ඉහත නාට්‍යයෙන් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.
- සංගීත භාවිතය මුල් කෘතියට අනුකූලව සිදු කළ යුතු වේ.
- මෙම ශීර්ෂයට අයත් කිසිදු නිර්මාණයක් උළෙලට පෙර හෝ පසුව කිසිදු විද්‍යුත් මාධ්‍යයකින් ප්‍රචාරය නො කළ යුතු ය.

**ඉහත ශීර්ෂ අංක 2.1.1, 2.1.2, 2.2.1, 2.2.2, 2.2.3, 2.2.4, 2.3.1 සඳහා පොදු කොන්දේසි**

- 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට පමණක් සීමා විය යුතුය
- කාලය උපරිම විනාඩි 15ක් විය යුතුය.
- නාට්‍ය පෙළට අනුව රංගනයට සහභාගී විය හැකි සංඛ්‍යාව තීරණය කළ හැක.
- තෝරාගත් නාට්‍ය කොටස, මුල් පිටපතට අනුකූල විය යුතු අතර කවර අයුරකින්වත් නාට්‍ය පෙළ වෙනස් කිරීමක් හෝ විකෘති කිරීමක් සිදු නො කළ යුතුය.
- අනෙකුත් ආනුෂංගික අංග නාට්‍යයේ මුල් කෘතියට හානි නො වන සේ භාවිත විය යුතු ය.

# 3 කාණ්ඩය – භූමිකා රංගන සහ කතා පුවත් ඉදිරිපත් කිරීම් (Storytelling)

## 3. භූමිකා රංගන හා කතා පුවත්

**වාචික අභිනය කේන්ද්‍රීයව රංගන හැකියාව ඇගයීම මෙහි මූලික අරමුණ වන මෙම කාණ්ඩයේ ඒකල භූමිකා රංගනවල දී අදාල ශීර්ෂයට නිර්දේශිත නාට්‍යයක යම් චරිතයක ඒකල භාෂණ (Monologue) කොටසක්, ආත්ම භාෂණ (Soliloquy) කොටසක් හෝ චරිත කිහිපයක සංවාද අතර ඇති සාපේක්ෂව දීර්ඝ හා අඛණ්ඩ භාෂණ කොටසක් රංගනයෙන් ඉදිරිපත් කිරීම අපේක්ෂිතය. ඒකල කතා පුවත් ඉදිරිපත් කිරීම්වල දී දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ වෙනත් සුදුසු කතාවක් ඒකල රංගනයක් ලෙස නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය. යුගල ශීර්ෂවල දී නිර්දේශිත නාට්‍යයක චරිත දෙකක් අතර අඛණ්ඩ සංවාද කොටසක් රංගනයෙන් ඉදිරිපත් කළ යුතු ය.**

**3.1.1 ප්‍රාථමික අංශය; යුගල**

- නිර්දේශිත නාට්‍ය: **මාෂා සහ වළහා** (ඩී. කුමාරගේ)
- කාලය විනාඩි 02කට ආසන්න විය යුතුය.

**3.2.1 කනිෂ්ඨ ද්විතියික අංශය; යුගල**

- නිර්දේශිත නාට්‍ය: **මාෂා සහ වළහා** (ඩී. කුමාරගේ)
- කාලය විනාඩි 02කට ආසන්න විය යුතුය.

**3.3.1 ජ්‍යේෂ්ඨ ද්විතියික අංශය; කතා පුවතක් ඉදිරිපත් කිරීම- ඒකල - පිරිමි (10-11 ශ්‍රේණි)**

- දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ වෙනත් සුදුසු කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කළ යුතු ය.
- රංග භාණ්ඩ, රංග වස්ත්‍ර ආදිය භාවිත කිරීමට ඉඩ ඇති අතර ස්ථානීය වශයෙන් සපයා ගත හැකි නම් මේසයක් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම පසුතල පමණක් භාවිත කළ හැක.
- ඉදිරිපත් කරන්නාට පමණක් හැසිරවිය හැකි ආකාරයේ සංගීත/ශබ්ද සංයෝජනයන්ට වුව ද ඉඩ ඇත.
- රූකඩ වුව ද භාවිත කිරීමට නිදහස තිබේ.
- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතුය.

**3.3.2 ජ්‍යේෂ්ඨ ද්විතියික අංශය; කතා පුවතක් ඉදිරිපත් කිරීම- ඒකල - ගැහැනු (10-11 ශ්‍රේණි)**

- දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ වෙනත් සුදුසු කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කළ යුතු ය.
- රංග භාණ්ඩ, රංග වස්ත්‍ර ආදිය භාවිත කිරීමට ඉඩ ඇති අතර ස්ථානීය වශයෙන් සපයා ගත හැකි නම් මේසයක් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම පසුතල පමණක් භාවිත කළ හැක.
- ඉදිරිපත් කරන්නාට පමණක් හැසිරවිය හැකි ආකාරයේ සංගීත/ශබ්ද සංයෝජනයන්ට වුව ද ඉඩ ඇත.
- රූකඩ වුව ද භාවිත කිරීමට නිදහස තිබේ.
- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතුය.

**3.3.3 ජ්‍යේෂ්ඨ ද්විතියික අංශය; ඒකල - පිරිමි (12-13 ශ්‍රේණි)**

- නිර්දේශිත නාට්‍ය: **ජූලියස් සීසර්** (විලියම් ශේක්ෂ්පියර්)
- කාලය විනාඩි 03 - 05 අතර විය යුතුය.

**3.3.4 ජ්‍යේෂ්ඨ ද්විතියික අංශය; ඒකල - ගැහැනු (12-13 ශ්‍රේණි)**

- නිර්දේශිත නාට්‍ය: **ඔතෙලෝ** (විලියම් ශේක්ෂ්පියර්)
- කාලය විනාඩි 03 - 05 අතර විය යුතුය.

**3.4.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය; යුගල (10-13 ශ්‍රේණි)**

- නිර්දේශිත නාට්‍ය: **සෙල්ලම් ගෙදර (හෙන්රික් ඉබ්සන්), ජුලියස් සීසර් (විලියම් ශේක්ෂ්පියර්)**
- කාලය විනාඩි 03 - 05 අතර විය යුතුය.

**3.4.2 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය; ඒකල -පිරිමි ප්‍රතිවිරෝධී ඒකල භාෂණ (10-13 ශ්‍රේණි)**

- එකිනෙකට ප්‍රතිවිරෝධී ඒකල භාෂණ (Contrasting Monologues) දෙකක් ඉදිරිපත් කළ යුතු ය.
- ශෛලිය, චරිත, උච්චාරණය, අවස්ථාවන්, මනෝභාවික අන්තර්ගතයන්, භාෂා ශෛලිය යනාදිය අතින් එකිනෙකට හාත්පසින්ම වෙනස් ඒකල භාෂණ දෙකක් විය යුතු ය.
- ලෝක සම්භාවනාවට පත් නාට්‍යකරුවන්ගේ නාට්‍යවලින් පරිවර්තනය කරගත් හෝ සිංහල බසින් නිෂ්පාදනය කෙරී රාජ්‍ය සම්මානයට පාත්‍ර වූ ස්වතන්ත්‍ර/පරිවර්තන නාට්‍යවලින් හෝ ඒකල භාෂණ කොටස් දෙක තෝරාගත යුතු ය.
- ඒකල භාෂණ කොටස් දෙක නාට්‍ය දෙකකින් හෝ එක ම නාට්‍යයකින් තෝරාගත හැකි ය.
- සලකුණු කරන ලද එක් නිශ්චිත ස්ථානයක පමණක් සිටිය යුතු ය.
- කිසිදු රංග භාණ්ඩයක් / ආධාරකයක් භාවිත කළ නොහැකි ය.
- කාලය විනාඩි 03 - 05 අතර විය යුතුය.

**3.4.3 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය; ඒකල - ගැහැනු ප්‍රතිවිරෝධී ඒකල භාෂණ (10-13 ශ්‍රේණි)**

- එකිනෙකට ප්‍රතිවිරෝධී ඒකල භාෂණ (Contrasting Monologues) දෙකක් ඉදිරිපත් කළ යුතු ය.
- ශෛලිය, චරිත, උච්චාරණය, අවස්ථාවන්, මනෝභාවික අන්තර්ගතයන්, භාෂා ශෛලිය යනාදිය අතින් එකිනෙකට හාත්පසින්ම වෙනස් ඒකල භාෂණ දෙකක් විය යුතු ය.
- ලෝක සම්භාවනාවට පත් නාට්‍යකරුවන්ගේ නාට්‍යවලින් පරිවර්තනය කරගත් හෝ සිංහල බසින් නිෂ්පාදනය කෙරී රාජ්‍ය සම්මානයට පාත්‍ර වූ ස්වතන්ත්‍ර/පරිවර්තන නාට්‍යවලින් හෝ ඒකල භාෂණ කොටස් දෙක තෝරාගත යුතු ය.
- ඒකල භාෂණ කොටස් දෙක නාට්‍ය දෙකකින් හෝ එක ම නාට්‍යයකින් තෝරාගත හැකි ය.
- සලකුණු කරන ලද එක් නිශ්චිත ස්ථානයක පමණක් සිටිය යුතු ය.
- කිසිදු රංග භාණ්ඩයක් / ආධාරකයක් භාවිත කළ නොහැකි ය.
- කාලය විනාඩි 03 - 05 අතර විය යුතුය.

අධ්‍යාපන අමාත්‍යාංශය මෙහෙයවන

**සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2017**

# පොදු අයදුම් පත්‍රය (A ආකෘතිය)

1. විද්‍යාලයේ නම :-
2. විද්‍යාලය අයත් වන පළාත :-
3. විද්‍යාලයේ ලිපිනය හා දුරකථන අංකය :-
4. විද්‍යාලය අයත් වන අධ්‍යාපන කලාපය :-

**1 කාණ්ඩයේ කෙටි නාට්‍ය නිෂ්පාදන සඳහා:**
(1 කාණ්ඩය සමග 2 කාණ්ඩයට අයදුම් කළ නොහැක. 3 කාණ්ඩයට අයදුම් කළ හැකිය.)

| 1 කාණ්ඩය | ශීර්ෂ අංකය | ශීර්ෂයේ නම | ඉදිරිපත් කරන ගුරු භවතාගේ / අධ්‍යක්ෂගේ නම | අත්සන | ජංගම දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 1.1.1. /1.2.1<br>1.2.2. /1.3.1<br>1.4.1 /1.5.1 | | | | | |
| | | | නාට්‍යයේ නම: | | |
| | | | | | |
| | | | නාට්‍යයේ නම: | | |

**2 කාණ්ඩයේ නිර්දේශිත නාට්‍ය ජවනිකා නිෂ්පාදන සඳහා:**
(2 කාණ්ඩය සමග 1 කාණ්ඩයට අයදුම් කළ නොහැක. 3 කාණ්ඩයට අයදුම් කළ හැකිය.)

| 2 කාණ්ඩය | ශීර්ෂ අංකය | ශීර්ෂයේ නම | ඉදිරිපත් කරන ගුරු භවතාගේ / අධ්‍යක්ෂගේ නම | අත්සන | ජංගම දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 2.1.1. /2.1.2<br>2.2.1. /2.2.2<br>2.2.3 /2.2.4<br>2.3.1 | | | | | |
| | | | නාට්‍යයේ නම: | | |
| | | | | | |
| | | | නාට්‍යයේ නම: | | |

**3 කාණ්ඩයේ භූමිකා රංගන හා කතාපුවත් ඉදිරිපත් කිරීම් සඳහා:**
(1 හෝ 2 කාණ්ඩයට ඉදිරිපත් වන්නේ නම් පමණක් 3 කාණ්ඩයට අයදුම් කළ හැකිය.)

| 3 කාණ්ඩය | ශීර්ෂ අංකය | ශීර්ෂයේ නම | ඉදිරිපත් කරන ගුරු භවතාගේ නම | අත්සන | ජංගම දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 3.1.1. /3.2.1<br>3.3.1. /3.3.2<br>3.3.3. /3.3.4<br>3.4.1./ 3.4.2<br>3.4.3. | | | | | |
| | | | | | |

සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල සඳහා නියමිත චක්‍රලේඛය මා ඇතුළු මීට දායක වන, ඉහත අත්සන් තබා ඇති ගුරු භවතුන් විසින් පෞද්ගලිකවම කියවා අවබෝධ කරගන්නා ලද

බවත් ඒ අනුව අප විදුහල ඉහත ශීර්ෂයන්ට අයදුම් කිරීමට සුදුසුකම් ලබන බවත්, එම **චක්‍රලේඛයේ සඳහන් සියලුම නීති රීති හා විධිවිධාන අනිවාර්යයෙන්ම පිළිපැදිමට බැඳී සිටින බවටත්, ඇගයීම් මණ්ඩලයේ ඕනෑම තීරණයක් පිළිගැනීමට බැඳී සිටින බවටත් මෙයින් සහතික කරමි.** සෑම අවස්ථාවකදීම මාගේ විද්‍යාලයේ සිසු/සිසුවියන් සහ ගුරු භවතුන් විනයානුකූලව හැසිරවීමේ වගකීම පෞද්ගලිකවම භාරගන්නා බවත් සහතික වෙමි.

විදුහල්පතිගේ අත්සන
නම:
දිනය:
නිල මුද්‍රාව